## පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය - 2014

පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනයේ 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1999 අංක 31 දරන පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතන පනතේ 18 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)සී වගන්තිය ප්‍රකාර ආයතනයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැළසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැළසුම් කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැළකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2. මූල්‍ය ප්‍රකාශන**

**2.1 තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 දිනට පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය සහ මුදල් ප්‍රවාහ, ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.2.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති**

රාජ්‍ය හා වෙනත් ප්‍රාග්ධන ප්‍රදාන යටතේ මිලදීගත් වත්කම් වාර්ෂිකව ක්ෂය කර ඇතත්, එය ක්‍රමක්ෂය කිරීම සඳහා ආයතනය විසින් ප්‍රතිපත්තියක් හඳුන්වා දී නොතිබුණි. සමාලෝචිත වර්ෂය අවසානයට සම්පූර්ණ ප්‍රාග්ධන ප්‍රදාන ප්‍රමාණය රු.88,486,678 ක් වූ අතර එමගින් ජනිත වූ වත්කම්වල ශුද්ධ වටිනාකම රු.69,909,841 ක් විය.

**2.2.2 ගිණුම්කරණ අඩුපාඩු**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) රජයේ ප්‍රදානයක් වශයෙන් ආයතනය වෙත ලැබී තිබුණු ඉඩම හා ගොඩනැගිල්ල තක්සේරු කර ගිණුම්ගතකර නොතිබුණි.

(ආ) පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශය යටතේ පවත්වාගෙන යන කණ්ඩලම සංචාරක නිවාසයට ආයතනය විසින් රු. 213,300 ක් වටිනා ලී බඩු හා සවි කිරීම් පවරා තිබූ නමුත් එය තවදුරටත් ආයතනය සතු වත්කම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඇ) සේවක ණය ගිණුමෙහි රු.52,811 ක අසාමාන්‍ය බැර ශේෂයක් පැවතියද එය නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

**2.2.3 නොසැසඳුණු පාලන ගිණුම්**

ගිණුම් විෂයයන් 03 ක් සම්බන්ධයෙන් ගිණුම අනුව ශේෂය හා විගණනයට ඉදිරිපත් කළ උපලේඛනය අනුව ශේෂය අතර රු.2,186,057 ක වෙනසක් නිරීක්ෂණය විය.

**2.3 ලැබිය යුතු ගිණුම්**

(අ) ආයතනය විසින් මුද්‍රණය කරන ලද දින පොත් සඳහා ගෙවීම් පරික්ෂාවේදී අමාත්‍යාංශය විසින් ලබාගත් දින පොත් වෙනුවෙන් ලැබිය යුතු රු.492,000 ක මුදල 2015 ජූලි 24 දින වන විටත් ආයතනයට ලැබී නොතිබුණු බව නිරීක්ෂණය විය.

(ආ) 2010 වර්ෂයට පෙර සිට නිලධාරීන්ගෙන් අයවිය යුතු අත්තිකාරම් රු.44,657 ක්, ආපදා ණය හා දේපළ ණය රු.771,825 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 2.4 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීමේ අවස්ථා නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 2005 අංක 5 දරන මුදල් පනතේ iii කොටස හා 2009 අංක 18 දරන (සංශෝධිත) මුදල් පනත | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින දක්වා නව ගොඩනැගිල්ල ඉදිකිරීම් කොන්ත්‍රාත්තුව සඳහා ගෙවන ලද රු. 38,147,382 කට අදාලව රු. 190,736 ක් වූ ඉදිකිරීම් කර්මාන්ත ඇප අරමුදල් බදු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| (i) මුදල් රෙගුලාසි 371 | (i)අවස්ථා 16 කදී ලබාදුන් රු.204,000 ක් වූ අත්තිකාරම් පියවීමට දින 45 සිට දින 351 දක්වා කාල පරාසයක් ගෙන තිබූ බව නිරීක්ෂණය විය. දෙන ලද අග්‍රිමය නිකුත් කරන ලද මුදල් වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පෙර පියවිය යුතු වුවද රු.33,000ක අත්තිකාරම් 03 ක් එසේ පියවා නොතිබුණි.<br><br>(ii)කිසිදු සැලැස්මකින් තොරව අත්තිකාරම් ලබාදීම හේතුවෙන් වියදම් කළ මුදලින් අඩකට වඩා හෝ ඊට ආසන්න ප්‍රමාණයක් ඉතිරි කර පියවා තිබූ අවස්ථා 43 ක්ද ලබාදුන් අත්තිකාරම පියවීමට ප්‍රථම නැවත අත්තිකාරම් ලබාදුන් අවස්ථාද අත්තිකාරම් ලබා ගැනීමෙන් පසු කිසිදු වියදමක් නොකර පියවා තිබූ අවස්ථා 10 ක් ද නිරීක්ෂණය විය. |
| (ii) මුදල් රෙගුලාසි 571 | 2002 වර්ෂයේ සිට 2010 වර්ෂය දක්වා වටිනාකම රු.57,250 ක් වූ ලංසු තැන්පතු 14 ක් නිරවුල් කිරීමට හෝ ආදායමට ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (iii) මුදල් රෙගුලාසි 756 හා 757 | වටිනාකම රු.295,948 ක් වූ පුස්තකාල පොත්, රු.438,382 ක් වූ ලිපිද්‍රව්‍ය හා රු.1,581,988 ක් වූ ප්‍රකාශන තොග සම්බන්ධයෙන් පැවැත්ම තහවුරු කර ගැනීම සඳහා භෞතික සමීක්ෂණයක් සිදුකර නොතිබුණි. |

## 2.5 ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2000 ජනවාරි 11 දිනැති අංක PF/PE/5 දරන භාණ්ඩාගාර චක්‍රලේඛයට අනුව වැටුපට අමතරව දීමනා ලබා ගැනීමේ දී අමාත්‍ය මණ්ඩලය හෝ රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය හෝ මහා භාණ්ඩාගාර ලේකම්ගේ අනුමැතිය ලබා නොගෙන අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියෙන් සමාලෝචිත වර්ෂය වෙනුවෙන් අධ්‍යක්ෂ ඇතුළු කාර්ය මණ්ඩලය සඳහා රු.307,522 ක දිරිදීමනා එක්සත් ජාතින්ගේ මානව ජනාවාස වැඩ සටහනේ ඉතිරි මුදලින් ගෙවා තිබුණි.

(ආ) 2000 පෙබරවාරි 21 හා 2013 ජනවාරි 11 දිනයන්හි කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමත කරන ලද කාර්ය මණ්ඩලයට අයත් නොවන තනතුරක් සඳහා මාධ්‍ය උපදේශකවරයෙකු කොන්ත්‍රාත් පදනම මත බඳවා ගෙන රු. 10,000 ක දිරිදීමනාවක්, රු. 669,600 ක වාර්ෂික වැටුපක් හා සෑම මාසයකම දින 5 ක් සඳහා නිවාඩු දින වැටුප් රු. 10,000 බැගින් සමාලෝචිත වර්ෂයේ රු.120,000 ක් ගෙවීම් කර තිබුණේ පැමිණීම හා පිටවීම පිළිබඳව කිසිදු ලිඛිත සාක්ෂියකින් සනාථකර ගැනීමකින් තොරවය. තවද සමාලෝචිත වර්ෂය වෙනුවෙන් වූ දුරකථන බිල්පත් සඳහා රු.33,170 ක්ද ගෙවීම් කර තිබුණි.

## 3 මූල්‍ය සමාලෝචනය

## 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය සඳහා ආයතනයේ මූල්‍ය ප්‍රතිඵලය රු. 2,502,704 ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු. 8,575,023 ක ඌනතාවයක් වූයෙන්, ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.6,072,319 ක වර්ධනයක් ඇතිවීම සඳහා මෙහෙයුම් ආදායම් රු.9,806,810 කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

## 4 මෙහෙයුම් සමාලෝචනය

## 4.1 කාර්යසාධනය

පළාත් සභා හා පළාත් පාලන ආයතනවල සභිකයින්, නිලධාරින් හා සේවකයින්ට ඔවුන්ගේ රාජකාරි කාර්යක්ෂම ලෙස හා ඵලදායි ලෙස ඉටු කිරීමට හැකි වන පරිදි වැඩමුළු හා පුහුණු පාඨමාලා පැවැත්වීමට අංශ 8 ක් සඳහා වාර්ෂික අයවැය මගින් රු. 20,000,000 ක මුදලක් වෙන්කර තිබුණි. සමාලෝචිත වර්ෂයේ දී මේ සඳහා රු. 21,466,810 ක් වැය කර තිබුණ ද, ඒ පිළිබඳව පරීක්ෂා කිරීමේදී ආයතනය සැලසුම් කළ කාර්යසාධනය සිදු වී නොතිබුණු බව හා එක් එක් අංශයේ ප්‍රගති වාර්තා හා සැලසුම් කළ කාර්යයන් අතර වෙනස්කම් පවතින බව නිරීක්ෂණය විය. විස්තර පහත දැක්වේ.

(අ) ඉංජිනේරු අංශය විසින් සැලසුම් කර තිබූ වැඩසටහන් 32 න් වැඩසටහන් 02 ක් පවත්වා නොතිබුණු අතර ඉන් එකක් පළාත් පාලන ඉංජිනේරු ශිල්පය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවක් වේ. පළාත් සභා මට්ටමේ පුහුණු වැඩසටහන් සඳහා වෙන් කරන ලද රු. 400,000 ක මුදලින් රු.194,016 ක් වැය කර වැඩසටහන් 02 ක් පමණක් පවත්වා තිබුණි.

(ආ) පොදු කළමනාකරණ අංශය සැලසුම් කරන ලද වැඩසටහන් 24 න් වැඩසටහන් 21 ක් පවත්වා තිබුණු අතර, ඇස්තමේන්තු කර තිබූ සහභාගිත්ව සංඛ්‍යාව 1,170 ක් වුවත් 711 ක් පුහුණු කිරීමෙන් එක් අයෙකු සඳහා දළ වියදම රු.2,620 ක් වී තිබූ බව නිරීක්ෂණය විය. මෙම අංශයේ මානව සම්පත් කළමනාකරණය පිළිබඳව සහතික පත්‍ර පාඨමාලාවක් පැවැත්වීමට සැලසුම් කර තිබුණු නමුත් එය පවත්වා නොතිබුණි.

(ඇ) පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනයේ පනත අනුව බාහිර පැවරුම් භාර ගැනීම එම ආයතනයේ අරමුණුගත කාර්යයක් වේ. ආයතනයේ ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් එවැනි කාර්යයක් ඉටුකිරීම සඳහා පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනයේ නිලධාරීන්ට 2000 ජනවාරි 11 දිනැති අංක PF/PE/5 දරන භාණ්ඩාගාර චක්‍රලේඛයට අනුව භාණ්ඩාගාර ලේකම්ගේ විධිමත් අනුමැතියක් ලබා නොගෙන රු. 279,700 ක විවිධ දීමනා ( සමස්ථ අධීක්ෂණය, අධීක්ෂණය හා සහභාගීත්වය, සම්බන්ධීකරණ දීමනා, ලේකම් දීමනා, විගණන දීමනා,ගණකාධිකරණ දීමනා, ලිපිකරු දීමනා හා කා.කා.ස. දීමනා) වෙනුවෙන් ගෙවීම් කර තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම අනුව මූල්‍ය කළමනාකරණ අංශයට රු. 2,400,000 ක මුදලක් ප්‍රතිපාදනය කර තිබූ නමුත් එම ප්‍රතිපාදනය ආවරණය වන පරිදි ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර නොතිබුණි. පළාත් පාලන හා මූල්‍ය කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමාව - 2012/2013 යන එක් අවුරුදු වැඩසටහන 2012 වර්ෂය අවසානයේ ආරම්භ කර 2013 වර්ෂයේ අවසාන කළ යුතු වුවත් 2014 වර්ෂයේද ජුනි මස දක්වා දින 11 ක් පවත්වා තිබුණි. පළාත් සභා මට්ටමෙන් පුහුණු වැඩසටහන් පැවැත්වීම සඳහා වෙන් කරන ලද රු. 400,000 ක මුදලින් රු.24,600 ක් වැය කර එක වැඩසටහනක් පවත්වා තිබුණි.

(ඉ) නීති අංශය සැලසුම් කරන ලද වැඩසටහන් සංඛ්‍යාව 21 ක් වුවද වැඩසටහන් 39 ක් පවත්වා තිබුණු අතර වෙන්කරන ලද රු. 2,000,000 ක මුදල ඉක්මවා රු. 1,179,460 ක් වැය කර තිබුණි.

(ඊ) පර්යේෂණ අංශය සැලසුම් කරන ලද වැඩසටහන් සංඛ්‍යාව 24 ක් වුවද වැඩසටහන් 27 ක් පවත්වා තිබුණු අතර වෙන්කරන ලද රු. 2,000,000 ක මුදල ඉක්මවා රු.227,504 ක් වැය කර තිබුණි.

(උ) පුහුණු වැඩසටහන් 09 කට අදාල වියදම් ගිණුමේ හා ඊට අදාල ප්‍රගති වාර්තාවල දැක්වෙන වියදම් අතර රු. 4,093,887 ක වෙනසක් නිරීක්ෂණය විය.

**4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

භාණ්ඩ සමීක්ෂණ වාර්තා අනුව රු.2,398,282 ක් වටිනා වත්කම් භෞතික පරීක්ෂාවේදී සත්‍යාපනය වී නොතිබුණි. එසේම රු.1,219,592 ක් වටිනා වත්කම් ආයතනයේ එක් එක් අංශ මඟින් ප්‍රයෝජනයට ගනිමින් පැවති අතර ඒවා වත්කම් ලේඛනයට ඇතුලත් වී නොතිබුණි.

**4.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනයේ නව ගොඩනැගිල්ල ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුවේ රු.10,639,382ක සේවය යෙදවීමේ අත්තිකාරමක් (Mobilization Advance) කොන්ත්‍රාත්කරුට ලබා දී තිබූ අතර ඒ සඳහා ලබා දී ඇති අත්තිකාරම් බැඳුම්කරය (Advance Bond) හා රු.2,660,000 ක කාර්යසාධන බැඳුම්කරය (Performance Bond) 2014 දෙසැම්බර් 01 දින වන විට අවසන් වී තිබුණු අතර ආයතනය විසින් 2015 ජුනි 25 වන විටත් එය දීර්ඝ කර ගැනීම සඳහා හෝ නව බැඳුම්කරයක් ලබා ගැනීමට හෝ අවශ්‍ය කටයුතු සිදු කර නොතිබුණි.

(ආ) පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය හා පළාත් සභා හා ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යාංශය ඉදිරි අවශ්‍යතා පිළිබඳ විධිමත් අධ්‍යයනයකින් තොරව ඉදිකිරීම් සැලසුම් කිරීම නිසා 2013 නොවැම්බර් 28 දිනට තට්ටු 4 ක් සඳහා රු.මිලියන 53 කට එළඹි කොන්ත්‍රාත් ගිවිසුම් මුදල පසුව රු.මිලියන 98 දක්වා වැඩි කිරීම නිසා සියයට 85 ක ප්‍රමාණයකින් මිල විචලනය සිදු වී තිබුණි. 2014 සැප්තැම්බර් 30 දිනට නිම කිරීමට නියමිතව තිබූ මෙම ගොඩනැගිල්ල 2015 ජුනි මස වන විටද අවසන් කර නොතිබුණු අතර පයිලින් (piling) වැඩ අවසන් වී අත්තිවාරම සකස් කර කණු උඩට නැංවීම පමණක් සිදු කර තිබුණි.

**4.4 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

භාණ්ඩ සමීක්ෂණ වාර්තා අනුව ආයතනයේ රු.3,212,800 ක් වටිනා වත්කම් නිශ්කාර්යව පවතින බව

අනාවරණය විය.

**4.5 හඳුනාගන්නා ලද පාඩු**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ආයතනයට ගණකාධිකාරි, පරිපාලන නිලධාරි හා පිළිගැනීමේ නිලධාරි හා පර්යේෂණ අධ්‍යයනයන් සඳහා නිලධාරින් බඳවා ගැනීමට රු.279,966 ක් වැය කර පුවත් පත් දැන්වීම් පළකර තිබුණද ඒ සඳහා කිසිදු නිලධාරියෙක් ආයතනය විසින් බඳවා ගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

(ආ) වටිනාකම රු.311,000 කට වෙබ් අඩවියක් නිර්මාණය කිරීම සඳහා අත්තිකාරම් ලෙස රු.77,500 ක් 2014 ඔක්තෝබර් 28 දින පෞද්ගලික ආයතනයකට ගෙවා තිබුණු අතර 2015 ජූනි මස 25 වන විටද එය නිම කර ගැනීම සඳහා අවශ්‍ය කටයුතු කර නොතිබුණු බැවින් අත්තිකාරම් ලෙස ගෙවා ඇති මුදල නිශ්කාර්ය වියදමක් බවට පත් වී තිබුණි.

**4.6 කාර්ය මණ්ඩල පරිපාලනය**

2014 දෙසැම්බර් 31 දිනට ආයතනයේ අනුමත සේවක සංඛ්‍යාව 48 ක් වුවද තථ්‍ය සංඛ්‍යාව 37 ක් වීමෙන් පුරප්පාඩු 11 ක් විය.

**5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

**5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

2003 ජූනි 02 දිනැති පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය අනුව ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන විගණනයට ඉදිරිපත් කළ යුතු බව සඳහන් වුවද, ආයතනය විසින් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන විගණනයට ඉදිරිපත් කර තිබුණේ 2015 මැයි 14 දින දීය.

**5.2 නොවිසඳී ඇති විගණන ඡේද**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2014 මාර්තු 05 දින පවත්වන ලද පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ තීරණය අනුව 2011 වර්ෂය හා ඊට පසු ගෙවන ලද ප්‍රසාද දීමනා සඳහා ආවරණ අනුමැතිය භාණ්ඩාගාරයෙන් ලබා ගත යුතු බව දන්වා ඇතත් 2015 ජූනි මස අවසන් වන විටත් එවැනි අනුමැතියක් ලබා ගෙන නොතිබුණි.

(ආ) 2010 වර්ෂයේදී නිලධාරියෙකු ඉල්ලුම් කරන ලද රු.1,447,800 ක දේපල ණය මුදලට වඩා රු. 100,000 ක් වැඩිපුර ගෙවා තිබුණි.

**6. පද්ධති හා පාලනයන්**

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු පිළිබඳව ආයතනයේ සභාපති වෙත වරින්වර වාර්තා කරන ලද අතර පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි කළමනාකරණයේ විශේෂ අවධානය යොමු කළ යුතුය.

(අ) වත්කම් කළමනාකරණය
(ආ) සේවක ණය
(ඇ) වැඩමුළු පැවත්වීම හා දීමනා ගෙවීම